# නර්තනය - 8 ශ්‍රේණිය

## (පළමු වාරය )



# 4.3 සවරං කවි



- දේශීය ගැමි නැටුම් අතර විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූ ඉතා අලංකාර නැටුමකි, සවරං නැටුම.
- සවරං ලී දෙක දැතින් ගෙන කරකවමින් නර්තනයේ යෙදෙන අතර ඒ සඳහා ගයනු ලබන කවි සවරං කවි ලෙස හැඳින්වේ.
- අනෙකුත් ගැමි ගායනාවල මෙන් ම අන්තර්ගතයේ ගැමි ඇදහිලි හා විශ්වාස මෙන් ම දෙවියන්ගෙන් අවසර ලබා ගැනීමක් දැකිය හැක.
- මෙහි විශේෂත්වය වන්නේ සවරම් ලීය ඇඟිලි අතරෙහි රඳවා ගෙන ලීය දෙපසෙහි ඇති සවරම් රැළි විසිරී යන අයුරින් කරකවමින් විවිධ රටා මවමින් නර්තනයේ යෙදීමයි.
- සවරම අඟල් 18ක් පමණ දිග අඟල් 2ක් පමණ රවුම් ලී දණ්ඩක දෙපසින් එල්ලා වැටෙන සේ රැළි යොදා සකස් කළ උපකරණයකි.

**තාල රූපය : මාත්‍රා 3 මැදුම් තනි තිත**

| | |
|---|---|
| පැවිය ගල් රුහැන් ජය රුස් | වඩින්නට |
| විරිය කර සිතින් ගනඳුරු | හරින්නට |
| කාරිය තමයි සවරං ගෙන | රඟන්නට |
| සූරිය දෙවි රජුනි අවසර දෙවන් | මට |
| | |
| දැතට ගන්නේ සවරං පවන් | සලන්නේ |
| සරඹ පාන්නේ පා පොඩි දෙක | හසුරන්නේ |
| ගීත ගයන්නේ සුමිහිරි තාල | වයන්නේ |
| සබයට එන්නේ සවරං නැටුම් | නටන්න |

**තාල රූපය : මාත්‍රා 4 මහ තනි තිත**

| | |
|---|---|
| මල් ගවසාලා කොණ්ඩය | බැඳලා |
| ඉණ තද කර සළු පැලඳ | ගෙනේ |
| පියයුරු නිමලා එන ළැම | උඳුලා |
| සළු පටකින් වසමින් | යසිනේ |
| | |
| සිරියල් දීලා කට රතු | කරලා |
| වා දළු මෙන් තොල් | දිලිසෙමිනේ |
| දෙවියන් වැඳලා මෙරහට | බැසලා |
| පටන් ගනිමු සවරං | රඟෙනේ |



<u>කාර්ය පත්‍රිකාව</u>

**(01)**

i. වෛරොඩි වන්නමේ තාල රූපය නම් කරන්න.

ii. ඊට අදාළ බෙර පදය ලියන්න.

iii. ගායනය ආරම්භයේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණය කුමක් ද?

iv. වන්නම් ප්‍රස්තුතයෙන් කුමක් කියවෙන්නේ ද?

v. වන්නමේ බෙර පදය ප්‍රස්තාර කර දක්වන්න.

**(02)**

i. සිරස පාද කවි ............................................ ගායනා යටතට ගැනේ.

ii. සාම්ප්‍රදායයන් ............................................ සිරස පාද කවි විවිධ නාද මාලාවෙන් ගායනා වේ.

iii. ආතුරයාගේ ........................................ සිට ........................................ තෙක් වැළඳී ඇති ................................................... දුරු කර සෙත් ශාන්තිය ළඟා කර දීම සඳහා ගායනා කරනු ලබන කවි ........................................ කවි නම් වේ.

iv. සිරස පාද කවි ............................................ තනි තිතට ගායනා කෙරේ.

v. පතුරු නැටුම අතීතයේ සිට ............................................ අරමුණු කොට නිර්මාණය විය.

vi. පතුරු නැටුම ............................................ නර්තන අංගයකි.

vii. පතුරු කවි අන්තර්ගතය විමසීමේ දී ගැමි සමාජයේ ඇදහිලි විශ්වාස, ............................................ සහ ............................................ වැනි ගුණාංග දැකිය හැක.

viii. පතුර ............................................ පමණක් ගෙන නර්තනය කිරීම විශේෂ ලක්ෂණයකි.

**(03) සුදුසු පිළිතුර යා කරන්න.**

| | | |
|---|---|---|
| i. | ශරීරාංගවලට ගසමින් හඬ උපදවයි. | වෛරොඩි වන්නම |
| ii. | ඇඟිලි අතරේ රඳවා කරකවමින් නර්තනය | සිරස පාද කවි |
| iii. | අවග්‍රහයෙන් ගායනය ආරම්භ වේ. | පතුරු නර්තනය |
| iv. | හිසේ සිට පාදාන්තය තෙක් දෝස දුරු කිරීම. | සවරං කවි |